සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

### පළමු වාර පරීක්ෂණය 2015

09 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

කාලය පැය 2 යි.

| නම/ විභාග අංකය: |
|---|

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 භීමපලාශ්‍රී රාගයේ ආරෝහණයේ වර්ජිත වනුයේ,

(1) ම, නි (2) රි, ධ (3) ම෴ (4) ග, නි

02 නි ස | ම ග රි | ස | ප නි ස මෙම ස්වර පේළිය ප්‍රස්ථාර වී ඇති තාලය වන්නේ,

(1) කෙහෙර්වා (2) දාදරා (3) ත්‍රිතාල් (4) ජප්

03 ධෛවතය වාදී ස්වරය ලෙස යෙදෙන රාගයකි.

(1) බිලාවල් (2) කාෆි (3) භීමපලාශ්‍රී (4) භූපාලි

04 හින්දුස්ථානී තාලයක දුර්වල ස්ථානය හඳුන්වනු ලබන්නේ,

(1) අනුතාලස්ථානයි. (2) සමග්‍රහයයි.

(3) විෂමග්‍රහයයි. (4) ඛලියයි.

05 සෙමිබ්‍රීව් හි (Semibreve) වටිනාකම මාත්‍රා,

(1) 2 කි. (2) 1 කි. (3) 4 කි. (4) 1/2 කි.

06 ''සඳුන් කොකුම් මොරසුගාන'' මෙම ගී පාදය අයත්වන ජන ගී විශේෂය,

(1) දරු නැලවිලි ගී (2) රබන් ගී

(3) නූර්ති ගී (4) වන්නම් ගී

07 උඩරට වන්නම් සඳහා යොදාගනු ලබන තාල වාද්‍ය භාණ්ඩයකි.

(1) දවුල (2) යක්බෙරය (3) තබ්ලාව (4) ගැටබෙරය

08 විදේශීය ආභාෂයක් නොලද ගී විශේෂයකි.

(1) නූර්ති (2) නාඩගම් (3) තුන්සරණේ ගී (4) ප්‍රශස්ති

09 1 2 3 | 1 2 3 4 ආදී වශයෙන් මාත්‍රා යෙදෙන තිත වන්නේ,

(1) මැදුම් මහ දෙතිතයි. (2) දාදරා තාලයයි.

(3) සුළු මහ දෙතිතයි (4) සුළු මැදුම් දෙතිතයි.

10 නිරිස, නිරිගරිස යන ස්වර කොටස් ඇතුලත් වන රාගය,

(1) භීමපලාශ්‍රී (2) භූපාලි (3) යමන් (4) කාෆි

The National e-learning Portal for The General Education

11 රටේ අගමැතිට සමාන කර ඇත්තේ පහත සඳහන් පාරිභාෂිත වචන වලින් කුමක්ද ?.

(1) වාදී (2) සංවාදී (3) අනුවාදී (4) විවාදී

12 (♩+♩) ක්‍රොචර්ට් නෝට්ස් දෙකක් එකතුවීමෙන් සෑදෙන තාල සංකේතය

(1) මිනිම් වේ. (Minim) (2) සෙමිබ්‍රීව් වේ. (Semibreve)

(3) ක්‍රොචර්ට් වේ. (Crotchet) (4) ක්වෙවර් වේ. (Quever)

13 කෙහෙර්වා තාලයේ යෙදෙන මාත්‍රා ගණන,

(1) 8 කි (2) 16 කි. (3) 10 කි (4) 6 කි.

14 ස රි | ග ම ප ම | ග රි | ස මෙම ස්වර පදයට අදාළ තාලය වන්නේ,

(1) ඣප් තාලයයි. (2) දීප්චන්දි තාලයයි.

(3) ත්‍රිතාලයයි. (4) කෙහෙර්වා තාලයයි.

15 නූර්ති නාට්‍යයට අදාළ කරුණු නොවන්නේ,

(1) උතුරු ඉන්දියානු සංගීතයේ ආභාෂය ලැබීම.

(2) ඡටා ශංබර්, අබ්දුල් සතාර් වැනි අය සංගීතය සැපයීම.

(3) මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත වීම.

(4) නවීණ තාක්ෂණය සහිත රංගශාලා පහසුකම් මැද ඉදිරිපත් කිරීම.

- **අංක 16-20 දක්වා වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

16 දේශීය තිත් ක්‍රමයේ ප්‍රධාන ආඝාත දෙක ලියා දක්වන්න. ....................................................

17 යමන් රාගයේ අනුවාදී ස්වර ලියා දක්වන්න. ..........................................................................

18 ගැටබෙරයෙන් වාදනය කළ තාල පදයක් ලියන්න. ................................................................

19 මහනුවර යුගයේ ප්‍රචලිත සංගීතාංගයක් ලියා දක්වන්න ........................................................

20 සඳැස්මත් යනු කෙටියෙන් හඳුන්වන්න. ...............................................................(2 x 20 = 40)

## II කොටස

- **තෝරාගත් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) භීමපලාශ්‍රී හා යමන් රාගයේ සර්ගම් ගීත වල ස්ථායී කොටස් වෙන වෙනම ලියා දක්වන්න. (ල. 08)

(2) යමන් රාගය ආශ්‍රිත සරල ගීතයක් ලියා දක්වන්න. ( ල .

04)

02 පහත සඳහන් රාග ලක්ෂණ අයත් වන රාගය ඉදිරියෙන් ලකුණු යොදන්න.

(1) ෂාඩව සම්පූර්ණ රාගයකි. ..............................................................

(2) ග, නි වාදි සංවාදි වේ. ..............................................................

(3) තීව්‍ර මධ්‍යමය යෙදේ. ..............................................................

(4) කෝමල ග, නි යෙදෙන රාගයකි. ..............................................................

(5) කාෆි ථාටයෙන් ඉපදේ. ..............................................................

(6) නි රි ග ම´ ප යන ස්වර සංගතිය යෙදේ. ..............................................................

(7) රාත්‍රී ප්‍රථම ප්‍රහරයෙහි ගැයේ. ..............................................................

(8) ස ස රි රි <u>ග ග</u> ම ම ප යන මුඛ්‍යාංගය යෙදේ. ..............................................................

(9) ෂාඩව ෂාඩව ජාති රාගයකි. ..............................................................

(10) ආරෝහණ, අවරෝහණයේ ම, නි වර්ජිත වේ. ..............................................................

(11) ස රි ග ම ප ධ යන ස්වර අනුවාදි වේ. ..............................................................

(12) දිනයේ දෙවන ප්‍රහරයේ යෙදේ. ..............................................................

(ල. 1x12=12)

03 (1) x, 2, 0, 3 ආදී වශයෙන් තාල සංඥා යෙදෙන තාල 02 ක් නම් කරන්න. (ල. 04)

(2) ඉන් එක් තාලයක් තාල මුලධර්ම සහිතව ප්‍රස්ථාර කරන්න. (ල. 04)

(3) ඔබ ප්‍රස්ථාර නොකළ තාලයට සමාන දේශීය තිත ප්‍රස්ථාර කරන්න. (ල. 04)

04 (1) බටහිර සංගීතයට අනුව රේඛා මණ්ඩලයක් ඇඳ ස්වර සප්තකය Crotchet Notes වලින් ලියා දක්වන්න. (ල. 06)